PAUL RATNAYEKE ASSOCIATES
ATTORNEYS-AT-LAW
COLOMBO

**කොළඹ දිසා අධිකරණයේදී**

නිහාල් ශ්‍රී අමරසේකර,
අංක.167/4, ශ්‍රී විපුලසේන මාවත,
කොළඹ 10.

**පැමිණිලිකරු**

නඩු අංකය: 19849/එම්.ආර්

- එදිරිව -

ගාමිණි ලක්ෂ්මන් පීරිස්,
"විසුම්පාය", ස්ටෙපල්ස් වීදිය,
කොළඹ 02. සහ
37, කිරුළ පෙදෙස,
කොළඹ 05.

**විත්තිකරු**

වර්ෂ 1998 ක්වූ අප්‍රේල් මස 03 වන දිනදිය.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගරු ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයින් වූ ***"පෝල් රත්නායක ඇසෝසියේට්ස්"*** නම් නාමධාරී විලාශයෙන් හවුල් ව්‍යාපාර කටයුතු කරන ජේම්ස් හෙන්රි පෝල් රත්නායක සහ උස්වත්ත ලියනගේ සුදත් නිලුපුල් ප්‍රසංස පෙරේරා සහ ඔවුන්ගේ සහායකයන් වන පුන්‍යකාන්ති නවරත්න මෙනෙවිය, ශලින්දි ජයසිංහ මිය, ඉන්ද්‍රාලෝජනි රාජගෝපාලන් මෙනෙවිය, චන්ද්‍රානි සූර්යආරච්චි මෙනෙවිය, කෝලිත සුසන්ත බණ්ඩාර විජේරත්න මහතා, අමාලි දීපානි අලව්ව මෙනෙවිය, රුවිරා ඇන්තනී මෙනෙවිය සහ ප්‍රසන්න ද සිල්වා යන නීතිඥවරුන් මඟින් පෙනී සිටින ඉහත නම සඳහන් විත්තිකරුගේ **විරෝධතා ප්‍රකාශයෙන්** මෙසේ ප්‍රකාශ කර සිටියි:-

1. වෙනත් කරුණු අතර මෙහි මින්මතු දක්වන හේතු නිසා විවාරණවලට පිළිතුරු දීමට විත්තිකරු නීතියෙන් බැඳී නැති බව විත්තිකරු ප්‍රකාශ කරයි.

2. විවාරණ ගොනු කිරීම ද ඒ සම්බන්ධයෙන් පැමිණිලිකරු විසින් ඊට පසුව ගත් පියවරද අධිකරණයේ ක්‍රියාවලිය අයථා පරිදි යොදා ගැනීමක් වන බව සහ/හෝ මේ නඩුව තීරණය කිරීම ප්‍රමාද කිරීමේ පරමාර්ථයෙන් කළ දෙයක් බව විත්තිකරු ප්‍රකාශ කරයි.

3. පැමිණිල්ලෙන් මෙම විත්තිකරුට විරුද්ධව නඩු නිමිත්තක් අනාවරණය නොවන බව ද ඒ අනුව විවාරණ කිසිවක් විත්තිකරුට භාරදිය නොහැකිව තිබුණු බව සහ/හෝ ඒවාට පිළිතුරු දීමට විත්තිකරුට නියම කළ නොහැකි බව විත්තිකරු ප්‍රකාශ කරයි.

4. ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කිරීමේ ලා ප්‍රමන්තය (ලැචේස්) සහ/හෝ අනිසි ප්‍රමාදය සම්බන්ධයෙන් පැමිණිලිකරු වරදකරු වන බව විත්තිකරු ප්‍රකාශ කරයි.

5. උද්දේශිත නඩුවේ කාර්ය සඳහා සද්භාවයෙන් විවාරණ ඉදිරිපත් කර නැති බව විත්තිකරු වැඩිදුරටත් ප්‍රකාශ කරයි.

6. විවාරණ අදාළ නොවන බව විත්තිකරු ප්‍රකාශ කරයි.

7. එකී විවාරණ නීතිය අනුව අපකීර්තිය ඇති කරන සුළු බව විත්තිකරු ප්‍රකාශ කරයි.

8. කෙසේ වුවද විවාරණ "උපායෙන් දැන ගැනීමට උත්සාහ කිරීමක්" (ෆිෂිං) වන බව විත්තිකරු ප්‍රකාශ කරයි.

9. උද්දේශිත විවාරණ වලින් විමසා ඇති කරුණු නඩුවේ මේ අවස්ථාවේ දී ප්‍රමාණවත් තරම් වැදගත් නොවන බව විත්තිකරු ප්‍රකාශ කරයි.

10. භාරදෙන ලද විවාරණ අසාධාරණ සහ/හෝ පීඩා සහගත සහ/හෝ අනිසි ලෙස දීර්ඝ වන බව විත්තිකරු ප්‍රකාශ කරයි.

11. සමහර විවාරණ සහ ඒවායේ පිළිතුරු වරප්‍රසාදලත් ඒවා බව විත්තිකරු ප්‍රකාශ කරයි.

12. විවාරණ මාලාව සමස්ථයක් වශයෙන් ගත් කල ඉතා දිග්ගැස්වූ සහ/හෝ පීඩාකාරී සහ/හෝ අනවශ්‍ය බව විත්තිකරු ප්‍රකාශ කරයි.

13. කෙසේ වුවද විවාරණ මෙම නඩුවේ විසදිය යුතු ප්‍රශ්න වලට අදාළ නොවන බව විත්තිකරු ප්‍රකාශ කරයි.

14. වෙනත් දේ අතර වූ ඉහත සඳහන් අවස්ථාගත කරුණු අනුව එකී විවාරණ කපාහරින ලෙස සහ/හෝ ඒවාට උත්තර දෙන ලෙසට පැමිණිලිකරු විසින් කර ඇති ඉල්ලීම නිෂ්ප්‍රභා කරන ලෙස විත්තිකරු ගෞරවයෙන් ඉල්ලා සිටී.

**එම නිසා** විත්තිකරු අයැද සිටින්නේ :-

(අ) පැමිණිලිකරු විසින් ඉදිරිපත් කරන ලද විවාරණ මාලාව කපා හරින ලෙස සහ/හෝ

(ආ) එකී විවාරණ වලට උත්තර දෙන ලෙසට පැමිණිලිකරු කර ඇති ඉල්ලීම නිෂ්ප්‍රභා කරන ලෙස,

(ඇ) නඩු ගාස්තු ප්‍රදානය කරන ලෙස, සහ,

(ඈ) මෙම අධිකරණයට උචිත යැයි හැඟෙන වෙනත් සහ වැඩිමනත් සහන ප්‍රදානය කරන ලෙසත්ය.

Sgd. Paul Ratnayeke Associates

**විත්තිකරුගේ ලේඛණගත නීතිඥවරු.**

**සකස් කරන ලද්දේ:**

නීතිඥ හර්ෂ අමරසේකර මහතා,
ජනාධිපති නීතිඥ රෝමේෂ් ද සිල්වා මහතා